# ජපන් භාෂා ප්‍රවීණතා පාඨමාලාව

# ක්‍රියාපදවල ශිෂ්ට ස්වරූපය සෑදීම සහ 'කන්ජි' අක්ෂර භාවිතය



ひな祭りのお菓子（ひなまつりのおかし）

**මේ දැක්වෙන්නේ 'කිනමත්සුරි' යන සුභ උත්සව අවස්ථාවේ දී ළමුන් සඳහාම නිෂ්පාදනය කළ ජපන් සාම්ප්‍රදායික රසකැවිලි වර්ගයකි.**

ගියවර කාලපයේදී ක්‍රියාපදවල ශිෂ්ට සහ අශිෂ්ට ස්වරූප පිළිබඳව අපි ඔබව දැනුවත් කළෙමු. මෙවර කලාපයෙන් එහි ඉතිරි කොටස ඉදිරිපත් කරමු.

ක්‍රියා පදවල ශිෂ්ට ස්වරූපය සාදා ගැනීමට, ඒ ඒ, ක්‍රියාපද අයත් වන කාණ්ඩවලට ආවේණික වූ නීතිරීති ඇත. ඒවා මතක තබා ගත යුතුයි.

1 වන කාණ්ඩයේ ක්‍රියාපදවල 'මස්' ස්වරූපය සාදා ගන්නා ආකාරය

**නීති අංක (1)**

| - ත්සු |
|---|
| + චිමස් |

උදා:

かつ　　かちます
たつ　　たちます

**නීති අංක (2)**

| - සු |
|---|
| + ෂිමස් |

උදා:

はなす　　はなします
けす　　けします

**නීති අංක (3)**

- උ { (ක්+උ) = කු, (ම් + උ) = මු, (න් + උ) = නු, (බ් + උ) = බු, (ර් + උ) = රු, (ග්උ + උ) = ගු }

+ ඉමස්

උදා:

かく　　かきます
よむ　　よみます
しぬ　　しにます
とぶ　　とびます
はしる　　はしります
あう　　あいます
およぐ　　およぎます

දැන් අපි බලමු නැවත වරක් ශබ්දකෝෂ ස්වරූපය හා 'මස්' ස්වරූපය එකිනෙකට සාපේක්ෂ ව.

(1) 2 වන කාණ්ඩයේ ක්‍රියාපදවල ශිෂ්ට ස්වරූපය සාදන අන්දම

| - රු |
|---|
| + මස් |

උදා:

たべる　　たべます
ねる　　ねます

(2) 3 වන කාණ්ඩයේ ක්‍රියාපදවල 'මස්' ස්වරූපය සෑදීම

සුරු ⟶ ෂිමස්
- කුරු ⟶ කිමස්

03. උදා:

する　　します
くる　　きます

| | ශබ්ද කෝෂ ස්වරූපය | 'මස්' ස්වරූපය |
|---|---|---|
| ලියනවා | かく | かきます |
| කනවා | たべる | たべます |
| එනවා | くる | きます |
| | වර්තමාන කාල ඇත යන අර්ථ අශිෂ්ට | වර්තමාන කාල ඇත යන අර්ථ ශිෂ්ට |

## ජපන් භාෂාවේ කන්ජි

ඔබ පසුගිය කලාපවල හිරගන, කතකන යන අක්ෂර වර්ග දෙක ගැන ඉගෙන ගත්තා. ඒවාට ආවේණික වූ නීතිරීති හා භාවිත කරන අන්දම ගැන ද ඉගෙන ගත්තා. මෙතැන් සිට 'කන්ජි' යනුවෙන් හඳුන්වන 'රූපාක්ෂර' ගැන ඉගෙන ගනිමු. වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම 'කන්ජි' යනු රූපාක්ෂර වේ. එනම් රූපයක් පදනම් කරගෙන/පාදක කරගෙන නඟා ඇති අක්ෂරයි. ජපන් භාෂාවේ මෙකී අක්ෂර ගැන තොරතුරු විමසීමේ දී එහි අතීතය ක්‍රි.පූ. 2700 තරම් ඈතට විහිදේ.

ගොකියෝ නමැති පඬිවරයා ක්‍රි.ව. 513 දී පමණ ජපානය වෙත මේ රූපාක්ෂර කලාව ගෙන ආවේ ය. චීනයේ 'සෝකෙත්සු' නම් තැනැත්තා පළමු වරට රූපාක්ෂර නිර්මාණය කළේ යයි ජනප්‍රවාදවල සඳහන් වේ. එහෙත් මෙය එක් පුද්ගලයකුගේ නිර්මාණයක් නොව කාලාන්තරයක් මුළුල්ලේ වැඩි දියුණු වූ දෙයක් යැයි සිතීම සාධාරණ ය.

මෙසේ නිර්මාණය වී ඇති රූපාක්ෂර සංඛ්‍යාව ජපන් භාෂාවේ පමණක් 30,000ක් පමණ ඇතැයි ගණන් බලා ඇත. එහෙත් සාමාන්‍ය ව්‍යවහාරයේ ඇත්තේ සුළු ප්‍රමාණයකි. මෙය 2000ට ආසන්න ය.

ඔබ සූදානම් වන **ජපන් ප්‍රවීණතා විභාගයට** ඇත්තේ ආසන්න වශයෙන් අක්ෂර 100ක් පමණ ය. මේවා පාඩම් කිරීමේ දී ඔබ සැලකිලිමත් විය යුතු අංග කිහිපයක් ඇත. ඒවානම්,

1) රූපාක්ෂරයේ අර්ථය
2) රූපාක්ෂරය ලියා නිවැරදි ක්‍රමය
3) රූපාක්ෂරය කියවන ක්‍රම
4) එකී කියවන ක්‍රම මූලාශ්‍ර කරගෙන වාක්‍යයක භාවිත කිරීම යනුවෙනි.

ජපන් භාෂාවේ රූපාක්ෂර කියවන ක්‍රම 2ක් ඇත.

1) ඔන් යොමි (චීන ක්‍රමයට කියවීම)
2) කුන් යොමි (ජපන් ක්‍රමයට කියවීම)

නිදසුන : පහත සඳහන් රූපාක්ෂරය දෙස බලමු.



ලියන ක්‍රමය:



1　2　3　4

අර්ථය: ගස යන අර්ථය

කියවන ආකාරය: ඔන්යොමි ⟶ මොකු,
කුන්යොමි ⟶ කි, ගි

භාවිත කිරීම:

1) මොකුසZයි = දැව　　මොකුයෝබි = බ්‍රහස්පතින්දා
2) නිහොන්ජින් ව කි දෙ ඉඑ ඔ ක්සුකුරිමස්



### 1 වන කන්ජි පාඩම

| | | | | |
|---|---|---|---|---|
| 一 | ひと（つ）<br>イチ | 一 | 一 | එක |
| 二 | ふた（つ）<br>ニ | 一 二 | 二 | දෙක |
| 三 | みっ（つ）<br>サン | 一 二 三 | 三 | තුන |
| 四 | よっ（つ） | 丨 冂 冂 四 四 | 四 | හතර |
| 五 | いつ（つ）<br>ゴ | 一 丅 五 五 | 五 | පහ |
| 六 | むっ（つ）<br>ロク | 丶 亠 六 六 | 六 | හය |
| 七 | なな（つ）<br>シチ | 一 七 | 七 | හත |
| 八 | やっ（つ）<br>ハチ | 丿 八 | 八 | අට |
| 九 | ここの（つ）<br>キュウ ク | 丿 九 | 九 | නවය |
| 十 | とお<br>ジュウ ジュッ | 一 十 | 十 | දහය |

එක -

一（いち）　එක
一つ（ひとつ）　එක
一日（いちにち）　එකදවසක්
一月（いちがつ）　ජනවාරි මාසය
一か月（いっかげつ）　එක් මාසයක්
一人（ひとり）　එක් පුද්ගලයෙක්

දෙක -

二つ（ふたつ）　දෙක
二日（ふつか）　දෙවෙනිදා
二人（ふたり）　පුද්ගලයෝ දෙදෙනෙක්
二月（にがつ）　පෙබරවාරි මාසය

තුන -

三つ（みっつ）　තුන
三日（みっか）　තුන්වෙනිදා
三人（さんにん）　පුද්ගලයෝ තුන්දෙනෙක්
三月（さんがつ）　මාර්තු මාසය

**මතු සම්බන්ධයි**

www.viplanka.com